# බළන්ගොඩ නගර සභාව

## 2022-11-16 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.11.16**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 6.ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රිනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | අයි.ඒ.එම්.ඉලංගකෝන් මැතිතුමිය |
| 10.ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම, මාර්ග හා පටු මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 17/8GB/RAM වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිල දී ගැනීම හා බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව දන්වන ලදී.

01. බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව සඳහා ලංසුපත් විවෘත කිරීම හා සුදුසු ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව සඳහා ටෙන්ඩර් පත් 03ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් 03 ම ලැබී තිබුණි. එහිදී වැඩිම මාසික ලංසු මුදල වන රු. 18,800.00 ක මුදල කොස්මුල් ගොඩගේ දමයන්ති මල්කාන්ති යන අය ඉදිරිපත් කර තිබුණි. නමුත් ඇයගේ අයදුම්පත අසම්පූර්ණ බැවින් ගාලෙවත්ත නිල්මිණි යන අය විසින් ඉදිරිපත් කර තිබූ දෙවන වැඩිම මාසික ලංසු මුදල වන රු. 18,000.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

  ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලද ඉහතින් ලබාගන්නා තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

02. බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කිරීම හා ටෙන්ඩර් ගිවිසුම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ටෙන්ඩර් කිරීම මඟින් යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම නොමැති වීම, ජල හා විදුලි බිල්පත් මුදල ටෙන්ඩර්කරු විසින් දරන බැවින් සභාව සතු මුදල් ඉතිරි වීම, දැනට ගොඩ ගැසී ඇති පොලිතින් ප්‍රමාණය අඩු වී ඉඩ කඩ ඇති වීම හා ප්ලාස්ටික් හා පොලිතින් සඳහා දැනට ලැබෙන මිලට වඩා වැඩි මිලක් ලැබීම

යන වාසි කිහිපයක් ලබා ගැනීමට හැකි වන බව ද මේ වන විට පාඩු ලබන තත්ත්වයේ පවතින අතර, පසුගිය දිනක කොළඹ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගී වූ අවස්ථාවේ දී PPP ( Public Private Practice) ක්‍රමයට කටයුතු කිරීමෙන් ලාභ ලබා ගත හැකි බවට සඳහන් කළ අතර, ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ටෙන්ඩර් කිරීම ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් බවට පත් වන බව ද පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභාවේ බැංකියවත්ත ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා 2023-01-01 සිට 2023-12-31 දක්වා වසරක කාලයක් වෙනුවෙන් ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීමටත්, අවම මාසික ලංසු මුදල වශයෙන් රු.20,000.00 ක මුදල සුදුසු බවටත් එම ටෙන්ඩර් ගිවිසුම්පත සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

03. පිරිවිතරවලට අනුව මාර්ග හා පටු මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 17/8GB/RAM වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී අයි.ඒ.එම්.ඉලංගකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සබරගමුව පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන මාර්ග හා පටු මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 17/8GB/RAM වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිල දී ගත යුතුව ඇති බව ද ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලැබී ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.00 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.